**කේ.යු. පුෂ්පකුමාර එ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 170 /2018 (2018.08.14 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්ය්‍යපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්ය්‍ය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - කේ.යු. පුෂ්පකුමාර
නොතිසි ලත් පාර්ශවය - සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**පෙනීසිටීම**
අභියාචක - කේ.යු. පුෂ්පකුමාර
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඒ.යු.එස්. විජේසූරිය, තොරතුරු නිලධාරී, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
කේ.කේ. විල්ලවරාජන්, තොරතුරු නිලධාරී , ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.10.16 |
| තොරතුරු නිළධාරියා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නොමැත |
| නම් කල නිළධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.12.21 |
| නම් කල නිළධාරියා තීරණය ලබා දුන් දිනය | පිළිතුරක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.01.23 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක විසින් 2017.10.16 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

***ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015.05.18 දින බාරගෙන ඇති 1631/15/1-23 දරන මෙ වනවිට අවුරුදු දෙකහමාරකට ආසන්න කාලයක් ගත වී ඇත්ත විසදුමක් දී නොමැති පැමිණිල්ල සම්බන්ධව,***

1. ***මෙම පැමිණිල්ලේ කටයුතු අවසන් වී ඇත්නම් එහි ප්‍රතිඵලය/නිගමනය/නිර්දේශය***
2. ***මෙම පැමිණිල්ලේ කටයුතු මෙතෙක් අවසන් වී නත්නම් එයට තුඩුදී ඇති හේතුව***

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ , පිළිතුරු සැපයීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2018.12.21 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචන යක් යොමු කරන ලදී . නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍ර තිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 23/01/2018 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරියෙන් විමසීමෙන් අනතුරුව, 2018.01.24 දිනැති ලිපියෙන් පොදු අධිකාරිය අභියාචක වෙත දන්වන ලද්දේ

*"ඔබ විසින් ඉල්ලා ඇති ලේඛන 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ඉල්ලීමට අවශ්‍යි නොවන අතර ඔබ පැමිණිලිකරු වශයෙන් ලබාගත හැකි තොරතුරක් වේ.*

*ඒ අනුව අධ්‍යක්ෂක (පරීක්ෂණ හා විමර්ශන ) වෙත යොමුවන ලෙස කාරුණිකව දන්වා සිටිමි . කෙසේ වුවද විමර්ශන ගොනුවට අදාල අවසන් වාර්තාව සකසීමට නියමිතව ඇත."*

**නියෝගය:**

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය පරිදි පොදු අධිකාරියක සන්තකයේ,භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරක් සඳහා ප්‍රවේශවීමට පුරවැසියන්ට අයිතියක් ඇත.
පනතේ 3(1) වගන්තිය පහත පරිදි වේ:
*3(1) මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පොදු අධිකාරියක සන්තකයේ,භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරුවලට ප්‍රවේශවීමේ අයිතිවාසිකම සෑම පුරවැසියෙකුටම තිබිය යුතුය.*
මෙය ව්‍යවස්ථාපිත අයිතිවාසිකමක් වන අතර එම තොරතුරු ලබාගැනීමට අභියාචකට විකල්ප ක්‍රමවේදයන් පවතින බවට දක්වමින් පැහැර හැරිය නොහැකිය.

එසේම, කොමිෂන් සභාවට පෙනී යන්නේ අදාළ විමර්ෂණය සිදු වී ඇති බවත් අවසන් වාර්තාව සකස් කිරීමට පවතින බවත්ය.

ඒ අනුව, විමර්ශනයේ තත්වය හා පොදු අධිකාරිය විසින් අදාළ කාලය වනවිට අවසන් වාර්තාව සකස්කර තිබීම විමසීම අත්‍යාවශ්‍ය කාරුණකි. ඉහත සඳහන් තත්වයන් අනුව, තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම්කරන ලද තොරතුරු ලබ දීමට පොදු අධිකාරියට නියම කරනු ලැබේ.

මේ අනුව මීට අදාළ වැඩිදුර පියවරයන් ගැනීම සම්බන්ධයෙන් අභියාචනය 2018.10.16 දිනට කල් තබනු ලැබේ.
අභියාචනය මෙලෙස කල් තබන ලදි.
*****

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ **170** /**2018** (**මෙම අභියාචන විභාගය 2018.10.16 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදි.**).

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |

**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - කේ.යූ. පුෂ්පකුමාර
**නොතිසි ලත් පාර්ශවය** - සභාපති, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**පෙනීසිටීම**
අභියාචක - කේ.යූ. පුෂ්පකුමාර
පොදු අධිකාරිය - ඩබ්ලිව්.ඒ.යූ.එස්. විජේසූරිය, තොරතුරු නිලධාරී, ශ්‍රීලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය විසින් කරුණු ඉදිරිපත් කර සිටියේ අදාළ විමර්ශනයේ නිර්දේශ කෙටුම්පත් කර තිබෙන බවත් එය කොමසාරිවරුන්ගේ අත්සන් ලබාගැනීමෙන් අනතුරුව නිකුත් කිරීමට හැකි බවයි.

**නියෝගය:**

ඒ අනුව පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියට මෙසේ නියෝග කර සිටී.
තොරතුරු ඉල්ලීමට අදාළ විස්තර සති 3ක් ඇතුළත අභියාචකට ලබාදිය යුතු බවත්, මාසයක කාලයක් තුළ පොදු අධිකාරියෙන් අදාළ වි ස්තර ලබා නොදුන්නේ නම් ඒ පිළිබඳව අභියාචක විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු බවයි.

ඉහත කොන්දේසිවලට යටත්ව අභියාචනය අවසන් කරනු ලැබේ.
කොමිෂන් සභා රීතින්හි , රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය , ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු.

............................................................
මහින්ද ගම්මම්පිල - සභාපති

............................................................
කිෂාලි පින්ටෝ-ජයවර්ධන - කොමිෂන් සභා සාමාජිකා

............................................................
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

............................................................
සෙල්වි තිරුචන්ද්‍රන් - කොමිෂන් සභා සාමාජිකා

............................................................
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජිකා
*****